# ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ යතුරු ලේඛක තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - III ශ්‍රේණිය

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ යතුරු ලේඛක තනතුරෙහි පුරප්පාඩු දාහතරක් (14) ක් සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරන ලද ශ්‍රී ලාංකේය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. බඳවා ගැනීම :

2.1 අධ්‍යාපන සුදුසුකම්:

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදි , අවම වශයෙන් විෂයයන් එකක් (01) වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබිම.

2.2 වෘත්තීය සුදුසුකම් :

කාර්මික විද්‍යාලය, ජාතික තරුණ සේවා සභාව,ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය , වෘත්තිය පුහුණු අධිකාරිය හා නිපුනතා සංවර්ධන අමාත්‍යාංශයේ ලියා පදිංචි වී ඇති වෙනත් පුහුණු ආයතන වලින් යතුරු ලියන පාඨමාලාව හෝ ලේකම් පරිචය පාඨමාලාව හදාරා සමත්ව තිබිම.

2.3 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිමටත් තනතුරේ රාජකාරි ඉටු කිරිමටත් ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.4 වෙනත් සුදුසුකම් :

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(II) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(III) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

03. වයස :

(I) අවම සිමාව : අවුරුදු 18 ට නොඅඩු විය යුතුය

(II) උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි විය යුතුය

04. වැටුප් පරිමාණය :

(I) වැටුප් කේත අංකය : MN-1-2025

(II) වැටුප් පරිමාණය : රු.45230 - 10x540 – 11x630 – 10x890 – 10x1190 - 78360

05. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(I) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.)

(II) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු වේ.

(III) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.

06. බඳවා ගන්නා ආකාරය :

වෘත්තීය පරීක්ෂණයක් සහ යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මඟින් බඳවා ගනු ලැබේ.

06.01 වෘත්තීය පරීක්ෂණය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සිංහල/ඉංග්‍රීසි යතුරු ලිවීම. (අඩුම වේගය විනාඩියකට වචන 20 බැගින් විනාඩි 20 ක් තුළ යතුරු ලිවීම.) | 100 | 40 |

06.02 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

ලකුණු ලබා දීමේ ක්‍රමය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| **1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br><br>අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ, මූලික සුදුසුකම් සඳහා සලකා බලනු ලබන විෂයයන් හැර ඉතිරි විෂයයන් 02 ක් සඳහා<br>• A සාමාර්ථය - ලකුණු 05<br>• B සාමාර්ථය - ලකුණු 03<br>• C සාමාර්ථය - ලකුණු 02<br><br>අ.පො.ස. උසස් පෙළ විභාගයේ, මූලික සුදුසුකම් සඳහා සලකා බලනු ලබන විෂයය හැර ඉතිරි විෂයයන් 02 ක් සඳහා<br>• A සාමාර්ථය - ලකුණු 05<br>• B සාමාර්ථය - ලකුණු 04<br>• C සාමාර්ථය - ලකුණු 03<br>• S සාමාර්ථය - ලකුණු 02 | 20 |
| **2. ක්ෂේත්‍රයට අදාළ අතිරේක වෘත්තීය සුදුසුකම්**<br><br>පෞද්ගලික / රජයේ ආයතනයක මාස 06ක යතුරු ලේඛක හෝ පරිගණක පුහුණුව ලබා තිබීම.<br><br>• මාස 06 සඳහා - ලකුණු 10<br>• මාස 12 සඳහා - ලකුණු 20 | 20 |

| | |
|---|---|
| 3. පළපුරුද්ද<br><br>රජයේ හෝ රජයට අනුබද්ධ හෝ පිළිගත් ආයතනයක යතුරු ලේඛක තනතුරක / පුද්ගලික සහකාර තනතුරක සේවය කර තිබීම.<br>• අවුරුදු 01 සඳහා - ලකුණු 05<br>• අවුරුදු 02 සඳහා - ලකුණු 10<br>• අවුරුදු 03 සඳහා - ලකුණු 15 | 15 |
| 4. ඉංග්‍රීසි භාෂා දැනුම<br><br>පිළිගත් ආයතනයකින් පාඨමාලාවක් හදාරා ලබා ගන්නා ලද, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා සහතිකය.<br>• මාස 03ක සහතිකයක් සඳහා - ලකුණු 05<br>• මාස 06ක සහතිකයක් සඳහා - ලකුණු 10<br>• අවුරුදු 01ක සහතිකයක් සඳහා - ලකුණු 20 | 20 |
| 5. පරිගණක දැනුම<br><br>පිළිගත් ආයතනයක පාඨමාලාවක් හදාරා ලබා ගන්නා ලද පරිගණක දැනුම පිළිබඳ ප්‍රවීණතා සහතිකය<br>• මාස 03ක් හෝ ඊට අඩු සහතිකයක් සඳහා - ලකුණු 05<br>• මාස 06 ක සහතිකයක් සඳහා - ලකුණු 10<br>• අවුරුදු 01ක සහතිකයක් සඳහා - ලකුණු 20 | 20 |
| **6. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන සන්නිවේදන කුසලතාවය** | 05 |

07. මෙහි සඳහන් ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026 ජූලි 31 වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ආණ්ඩුවේ රස පරීක්ෂක, නො.31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "යතුරු ලේඛක තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

08. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

09. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් තීරණය කරනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයට කැඳවීම ස්ථිර පත්වීමක් ලබා ගැනීමට සුදුසුකමක් නොවේ.

10. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් තනතුරට බඳවා ගනු ලැබේ.

11. මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය ආණ්ඩුවේ රස පරීක්ෂක සතු වේ.

එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා
ආණ්ඩුවේ රස පරීක්ෂක

දිනය - ....................

**<u>ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ යතුරු ලේඛක III ශ්‍රේණිය තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම.</u>**

**<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>**

01. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) - ..........................................................................
(ඉංග්‍රීසියෙන්) - ..........................................................................

02. මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) - ..........................................................................
(ඉංග්‍රීසියෙන්) - ..........................................................................

03. උපන්දිනය - වර්ෂය ............. මාස............. දිනය ..............

වයස 2026.07.31 දිනට - ..........................................................................

04.ස්ත්‍රී/පුරුෂභාවය - ..........................................................................

05.විවාහක/ අවිවාහක බව - ..........................................................................

06. දුරකථන අංකය - ..........................................................................

07. විද්‍යුත් තැපැල් ලිපිනය - ..........................................................................

08. ජාතික හැඳුනුම්පත් අංකය - ..........................................................................

09. ස්ථිර ලිපිනය - .........................................................................

10. අධ්‍යාපන සුදුසුකම් - .........................................................................

11. වෘත්තීය සුදුසුකම් - .........................................................................

12. වෙනත් සුදුසුකම් - .........................................................................

ඉහත සඳහන් තොරතුරුසත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය - ........................... අයදුම්කරුගේ අත්සන - ..............................